## ශීර්ෂය 271 - ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

-----------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්වාගණනය කල මතය

ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්වාගණනය කල මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරිම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම් ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වාර්ෂික මූල්‍ය ප්‍රකාශන<br>2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 2019 පෙබරවාරි 28 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් එය මාස 01 ක ප්‍රමාදයකින් පසු 2019 අප්‍රේල් 1 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව පරිදි නියමිත දිනට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු වීම. | මින් ඉදිරියේදී පෙබරවාරි මස 28 දිනට ප්‍රථම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව කාරුණිකව පෙන්වා දෙමි. |

### 1.6.2 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම.** |
|---|---|---|
| දුම්රිය බලපත්‍ර සඳහා වූ වියදම් 271-1-1-0-1003 වැය විෂයට හර කළ යුතු වුවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් දුම්රිය බලපත්‍ර වියදම් රු.76,420 ක් වැය විෂය 271-1-1-0-1401 වැය විෂයයට හර කිරීම නිසා, මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනයේ අනෙකුත් භාණ්ඩ හා සේවා ප්‍රතිලාභ වියදම රු. 76,420 කින් වැඩියෙන් නිරූපනය වීම. | දුම්රිය බලපත්‍ර සඳහා වූ වියදම වැය විෂය 1003ට හර කළ යුතු වීම. | ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ සාමාන්‍යාධිකාරීගේ 2018.01.08 දිනැති ලිපියේ සඳහන් පරිදි චක්‍රලේඛ අංක ජී.එම්.ආර්**/** සි.ඒ.ආර් **(ආර්.II)01.01/ 2016** අනුව දුම්රිය ගමන් බලපත්‍ර වියදම් සඳහා යොදා ගන්නා විෂය 1003 යන වැය විෂය 2018 ජනවාරි මස සිට ක්‍රියාත්මක වන පරිදි 1401 වැය විෂය යටතේ දැක්වෙන වියදමක් ලෙස මාරු කර තිබීම. |

### 1.6.3 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

මේ සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ දැක්වීම අදහස් |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශන වාර්තා කිරීමේ පදනම යටතේ දේපළ, පිරියත හා උපකරණ හඳුනා ගැනීම හා මැනීම පිරිවැයට සිදුකරන බවත්, පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදා ගන්නා බවත්, සඳහන් කර තිබුණු නමුත් පිරිවැයට හඳුනා ගන්නා ලද වත්කම් සහ තක්සේරු කරන ලද වත්කම් මොනවාද යන්න මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සඳහන් කර නොතිබුණි. | දේපල පිරියත හා උපකරණ හඳුනාගැනීම සහ මැනීම සිදුකරන පදනම නිශ්චිතව සඳහන් කළ යුතු වේ. | මූල්‍ය ප්‍රකාශන ආකෘතියෙහි දේපල පිරියත හා උපකරණ හඳුනාගැනීම සිදුකරන පදනම දැක්වීමට එම ආකෘතියේ ඉඩ සලසා නොමැති බවත්, එනමුදු ගිණුම්ගත කිරීමේදී පිරිවැයට මෙන්ම, තක්සේරු අගය මතද වත්කම් අගයන් සටහන් කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ආ) | මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය අනුව, 2018 ජනවාරි 01 දිනට ස්ථාවර වත්කම් වල වටිනාකම රු.1,601,358,977 ක් ලෙස දක්වා තිබුණු නමුත් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ මූල්‍ය නොවන වත්කම් වල 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.1,269,133,533 ක් ලෙස රු.332,225,444 ක් වැඩියෙන් දක්වා තිබුණි. | මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වූ ශේෂය සමඟ සමාන විය යුතුය. | 2018 ජනවාරි 01 දිනට ස්ථාවර වත්කම්වල වටිනාකම රු.1,601,358,977 (ඒසිඒ-6) පිටු අංක 33හි නිවැරදි ලෙස දක්වා ඇති බවත්, එය මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ මූල්‍ය නොවන වත්කම්වල 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.1,269,133,533ක් වැරදි ලෙස පෙන්වා දී ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | භාණ්ඩාගාර පොත් අනුව 2018 දෙසැම්බර් 31 දිනට මුල්‍ය නොවන වත්කම් වල වටිනාකම රු.820,091,564 ක් වූ නමුත් මුල්‍ය තත්ත්වය පිලිබඳ ප්‍රකාශය අනුව එය රු.1,636,948,492 ක් ලෙස දක්වා තිබීම නිසා රු. 818,856,928 ක වෙනසක් තිබුණි. | මුල්‍ය නොවන වත්කම්වල ශේෂය එම දිනට භාණ්ඩාගාර පොත් සමඟ සමාන විය යුතුය. | 2018 වර්ෂ අවසානයේදී වෙබ් අඩවිය **(on line)** හරහා භාණ්ඩාගාර පොත් අනුව ශේෂය හා මුල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි අගයන් සැසඳීමේදී එය සමාන වූ බව කාරුණිකව පෙන්වා දෙමි. එනමුදු 2019 වර්ෂයේදී පෙබරවාරි මාසයේදී භාණ්ඩාගාර පොත්වල අගය මෙසේ වැරදි අගයක් පෙන්වා දී ඇත. මෙය නිවැරදි කර ගැනීමට අදාල කටයුතු කෙරෙමින් පවතී. |
| (ඈ) | මුල්‍ය ප්‍රකාශනයේ (ඒ.සී.ඒ - 6) හි අපහරණයන් නොමැති බවට සඳහන් කර තිබුණු නමුත් භාණ්ඩාගාර පොත් අනුව රු.7,556,948 ක වත්කම් අපහරණය කර ඇති බව දක්වා තිබීම නිසා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වත්කම් වල නිවැරදි වටිනාකම මුල්‍ය ප්‍රකාශන තුලින් නිරූපණය නොවීම. | සමාලෝචිත වර්ෂයේදී සිදුකළ අපහරණයන් මුල්‍ය ප්‍රකාශනවල සඳහන් කළ යුතු වේ. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් මෙම මුල්‍ය ප්‍රකාශන පිළියෙළ කර අවසන් වූ පසු භාණ්ඩ අපහරණය කිරීමට කටයුතු කර ඇති බැවින්, එම අපහරණය කරන ලද වත්කම්වල වටිනාකම් මුල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වී නොමැති අතර, මින් ඉදිරියේදී මෙවැනි දෑ වළක්වා ගැනීමට කටයුතු සම්පාදනය කරන බව, කාරුණිකව සඳහන් කරමි. |

**1.6.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය.**

මේ සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| (අ) | මුල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ අත්තිකාරම් ගිණුම්වල මුල්‍ය වත්කම් රු.101,653,819 ක් ලෙස දක්වා තිබුණු නමුත් සහ භාණ්ඩාගාර මුද්‍රිත අනුව එම අගය රු. 101,736,359 ක් වුයෙන් රු.82,540 ක වෙනසක් තිබුණි. | භාණ්ඩාගාර පොත් සමඟ සමාන විය යුතු වේ. | එහි වටිනාකම වන රු. 101, 653,819 සමන්විත වන්නේ භාණ්ඩාගාර මුද්‍රිත අනුව, රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්වල නිවැරදි ශේෂය වන රු.100,000,903 සහ වෙනත් අත්තිකාරම් වන රු.1,652,917 සමුපකාර තොග වෙළඳ සංස්ථාවට වී මිලදී ගැනීම සඳහා ලබාදුන් අත්තිකාරම් වන අතර, එය මේ වන විට පොත් වලින් කපා හැරීමට රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට යවා ඇති හෙයින්, භාණ්ඩාගාර මුද්‍රිත සටහන්වල එය සටහන් නොවන බව, කාරුණිකව පෙන්වා දෙමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙළ කර තිබුණු රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් සැසඳුම් ප්‍රකාශයට අනුව 2018 දෙසැම්බර් 31 දිනට අය වීමට තිබුණු ණය ශේෂවල එකතුව රු.1,947,451 ක් වූ අතර ඒ තුල වර්ෂ 5 ඉක්මවා තිබුණු රු.1,049,306 ක ණය ශේෂයන්ද ඇතුලත් වී තිබුණි. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට ක්‍රියාකළ යුතු වේ. | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්වල හිඟ හිටි ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු කරගෙන යනු ලබන බව කාරුණිකව සඳහන් කරමි. |

### 1.6.5 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| නිරීක්ෂණය | නිර්දේශය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අදහස් දැක්වීම |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති එලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | 2018 අංක 19 දරණ ජාතික විගණන පනත අනුව මින් ඉදිරියේදී එවැනි සමාලෝචනයක් සිදුකර කරනු ලැබේ. |

### 1.6.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | | |
| | | රු. | | | |
| (i) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | | |
| | XIX පරිච්ජේදයේ 5.2.1 ජේදය. | 825,600 | නිවාස කුලී අයකර නොතිබීම. | ආයතන සංග්‍රහය ප්‍රකාරව ක්‍රියා කළ යුතුය. | නිවාස කමිටුව මඟින් ලබා ගත් නිර්දේශ මත ඇතැම් නිවාස සඳහා තක්සේරු කුළිය අය කිරීමට කටයුතු කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| XIX පරිච්ඡේදයේ 7.2 | - | දණ්ඩන කුලී අයකර නොතිබීම. | ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | දිස්ත්‍රික්කයේ පවතින තනතුරු පුරප්පාඩු හේතුවෙන් ස්ථාන මාරු ක්‍රියාවලිය යටතේ වුවද ස්ථාන මාරු නොලබා දිස්ත්‍රික්කයේ සේවය කරන නිලධාරීන්ගේ නවාතැන් පහසුකම් ලබා දීමේදී සේවා අවශ්‍යතාවය සහ එම නිලධාරීන්ගේ නවාතැන් අවශ්‍යතාවය ද සලකා බලා වසර 05 කට වැඩි කාලයක් නිවාස සාධාරණ පදනමක් මත වෙන් කර දීමට නිවාස කමිටුව තීරණය කර ඇත. |
| (ii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | | |
| -------------------------------- | | | | |
| මුදල් රෙගුලාසි 65 (4) (XI) ජේදය | 1,150,000 | පරිපූරක ඇස්තමේන්තු මඟින් සළසා ගත් ප්‍රතිපාදන වෙනත් වැය විෂයන් සඳහා මාරු කර තිබීම. | පරිපූරක ඇස්තමේන්තු මඟින් සළසා ගත් ප්‍රතිපාදන වෙනත් වැය විෂයන් සඳහා මාරු කළ නොහැක. | 2018 වර්ෂයේදී මැයි මස හා ජුනි මස නව රාජ්‍ය කළමනාකරණ සහකාරවරුන් 74, ග්‍රාම නිලධාරි 41, කාර්යාල කාර්ය සහයකවරුන් 12ක් බඳවාගත් බැවින්, ඔවුන්ගේ පුද්ගල පඩිනඩි ගෙවීමට ප්‍රතිපාදන හිඟ වූ බැවින් මෙම මාරු කිරීම කර ඇත. |
| (iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | | | |
| ------------------------------- | | | | |
| 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයේ 3.1 ජේදය. | - | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වාහන සම්බන්ධයෙන් ඉන්ධන ධහනය පිලිබඳ පරීක්ෂාවක් කර නොතිබුණි. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ඉන්ධන දහනය සම්බන්ධයෙන් මෙම පරීක්ෂාව ඉදිරියේදී කිරීමට කටයුතු කරනු ලැබේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

වාර්ෂික අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරිම,ප්‍රතිපාදන මාරු කිරීම, ප්‍රතිපාදන උපයෝජනය කිරීම සහ ඉතිරිවීම් සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරික්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | තම දෙපාර්තමේන්තුවට අදාළ ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන්ම නිවැරදිව පිළියෙළ කර ඇති බවට වගබලා ගැනීම ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වුවත්, සමාලෝචිත වර්ෂයේදී 1401 සහ 2401 වැය විෂයයන් 2 ක් සඳහා සලසාගත් රු.1,147,500 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් ඉතිරිවීම රු.896,136 ක් වූ අතර එය සියයට 48 සිට සියයට 60 දක්වා පරාසයක පැවතුණි. | මුදල් රෙගුලාසි 50 **(II)** ප්‍රකාරව කටයුතු කල යුතුය. | වියදම් පාලනය හා අවශ්‍යතාවය පැන නොනැගුණු නිසා මෙම ප්‍රතිපාදන ඉතිරි වී ඇත. |
| (ආ) | සහේතුකව ප්‍රමාණුමාන කළහැකි සියලුම සේවාවන් ඇස්තමේන්තුවලට ඇතුළත් කර ඇති බවට සහ එම මුදල් වර්ෂය තුල තම දෙපාර්තමේන්තුවට ඉටුකළ හැකි ශක්තිය ඇතුළත බවද, ගණන්දීමේ නිලධාරියා විශේෂයෙන් වගබලා ගත යුතු වුවත් 1203 සහ 1404 වැය විෂයයන් දෙක වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ඇස්තමේන්තුවෙන් රු.1,650,000 ක් වෙන් කර තිබුණු නමුත් එයින් රු.860,500 ක් වෙනත් වැය විෂයන් වලට මාරු කර තිබුණි. එය ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් සියයට 40 සිට සියයට 63 ක් දක්වා පරාසයක විහිදී තිබුණි. | මුදල් රෙගුලාසි 50 **(I)** ප්‍රකාරව කටයුතු කල යුතුය. | මෙම වැය විෂයන්හි වියදම් පාලනය හා අවශ්‍යතාවය පැන නොනැගුණු නිසා එම වැය විෂයන්හි ඉතිරිවීම් මුදල් රෙගුලාසි 66 ට අනුව වෙනත් වැය විෂයන් වලට මාරුකර ඇත. |

## 2.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

මේ සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වාරිමාර්ග හා ජල සම්පත් කලමනාකරණ අමාත්‍යාංශයෙන් (වැය ශීර්ෂය 198) වෙන්කර දී තිබුණු රු. 3,959,512 ක ප්‍රතිපාදන වලින් රු.1,632,126 ක් හෙවත් සියයට 41 ක් ඉතිරි වී තිබුණි. | ලබාදෙන ප්‍රතිපාදන උපයෝජනය කිරීම සඳහා ක්‍රියාකාරි සැලසුම් සකස් කර ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතු බව. | වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලින් ලබාදෙන ප්‍රතිපාදන නිදහස් කිරීම් පමණක් අප ආයතනයෙන් සිදුවන අතර, එහි ඉතිරිවීම් අප ආයතන පාලනයෙන් බැහැර ක්‍රියාවලියක් බව. |
| (ආ) | ධිවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයේ (වැය ශීර්ෂය 151) න් වෙන්කර දී තිබුණු රු. 68,382,159 ක ප්‍රතිපාදන වලින් රු.28,741,852 ක් හෙවත් සියයට 42 ක් ඉතිරි වී තිබුණි. | ලබාදෙන ප්‍රතිපාදන උපයෝජනය කිරීම සඳහා ක්‍රියාකාරි සැලසුම් සකස් කර ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතු බව. | 2018 වර්ෂයේ සංවර්ධන යෝජනා සඳහා ප්‍රතිපාදන හා අග්‍රිම මුදල් මෙම කාර්යාලය වෙත ලැබුණේ 2018 වර්ෂයේ දෙසැම්බර් මුල් භාගයේදීය. ඒ අනුව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අනුමත ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත අදාල ප්‍රතිපාදන මුදල්/ අග්‍රිම නිදහස් කිරීමට කටයුතු කරන ලද නමුත් එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන ක්‍රියා පිළිවෙත් හා අනෙකුත් ක්‍රමවේදයන් අනුගමනය කිරීමට ප්‍රමාණවත් කාලයක් නොතිබුණි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 දේශීය අරමුදල්වලින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සංවර්ධන කාර්යභාර්ය අමාත්‍යාංශයේ ලේකම් විසින් 2018 ජනවාරි 30 දින නිකුත් කරන ලද එම්.ඩී.ඒ/01/2018 දරණ චක්‍රලේඛයේ 3.ජේදය අනුව වැය විෂය - 104-02-06-06-2506 ග්‍රාමීය පාසල්වල යටිතල පහසුකම් යටතේ සනීපාරක්ෂක පහසුකම් සහ විදුලි | සංවර්ධන ව්‍යාපෘති තෝරා ගැනීමේදී අදාළ චක්‍රලේඛයේ නිර්ණායකයන්ට අනුකූලව සහ මූලික මානුෂික අවශ්‍යතාවයට | පසුගාමී කලාප සංවර්ධන වැඩසටහන - 2018 යටතේ ත්‍රිකුණාමලය දිසාපතිගේ අංක ජීඒටී/පීඑල්ඒ/ආර්ආර්ඩීපී/ඩීඕ. **05/17**හා 2018/08/21 දිනැති ලිපිය මගින් අනුමත කර අප වෙත යොමු කළ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අබ්දුල් මහරුෆ් මැතිතුමාගේ සංවර්ධන යෝජනා එකොළහ (11)ට |

| | | |
|---|---|---|
| බලය ලබාදීම ආදී කටයුතු සඳහා වූ ව්‍යාපෘති ක්‍රියාත්මක කළයුතු වුවත්, කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අල් - ෂෆා, අල් – තාරික් කණිෂ්ඨ, අල් – නජා ආරාබි විද්‍යාලය යන පාසැල 03 ක් වෙත ජයා පිටපත් යන්ත්‍ර 03 ක් ලබාදීම සඳහා රු. 390,000 ක් ගෙවා තිබුණි. | ප්‍රමුඛතාවය දිය යුතු බව. | අදාලව ත්‍රිකුණාමලය දිසාපතිගේ අංක ජීඒටී/ඒසිසි-**2**/ඒඑල්එල්ඔසි/**104**/ඒ එම්ඒ**02/2018** හා 2018/08/31 දිනැති ප්‍රතිපාදන නිදහස් කිරීමේ ලිපි හා බැදේ. ඒ අනුව අල්නජා අරාබි විද්‍යාලය, අස්සෆා විද්‍යාලය හා අල් තාරික් ප්‍රාථමික විද්‍යාල සඳහා ඡායා පිටපත් යන්ත්‍ර ලබාදීම යන සංවර්ධන ව්‍යාපෘති තුන(03) ආදාල ප්‍රසම්පාදන ක්‍රියාවලීන් අනුගමනය කරමින් අප කාර්යාලය මඟින් ක්‍රියාත්මක කළ බව කන්තලේ ප්‍රාදේශීය ලේකම් විසින් දන්වා ඇති බව. |

**3.2 වත්කම් කළමනාකරණය**

**---------------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පාවිච්චියෙන් අනතුරු වන ලද වාහන 06 ක් සම්බන්ධයෙන් අපහරණය කිරීමේ කටයුතු නොකර 2016 වර්ෂයේ සිට දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයේ ස්වාභාවික ආපදාවන්ට ලක්වන පරිදි ගාල්කර තිබුණි. | පාවිච්චිය අතහැර දමන ලද වාහන සම්බන්ධයෙන් 2015 ජුලි 10 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2015 හා 2018 මාර්තු 19 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2018 පරිදි අපහරණය කිරීමට කඩිනම් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතු බව. | 2019 වර්ෂයේ 03වන කාර්තුව අවසානයට පෙර අපහරණ කටයුතු නිම කිරීමට සැලසුම් කර ඇත. |

**3.3 කළමනාකරණ දූර්වලතා**

**---------------------------**

මේ සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ඇතුළු වරාය පාරේ පිහිටි අංක 1 **B** හා 3**B** රජයේ නිවාස වල පදිංචිකරුවන්ගෙන් අයවිය යුතු රු.387,800 ක හිඟ නිවාස කුලී අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අය නොවන හිඟ නිවාස කුලී අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගත යුතු බව. | එක් නිළධාරියකු සම්පූර්ණ හිඟ මුදල් 2019.07.10 දින ගෙවා නිරවුල් කර ඇත.<br><br>එක් නිළධාරියකු ගෙවිය යුතු රු.39,375 ක හිඟ මුදල වහාම නිරවුල් කරන ලෙස අදාළ දෙපාර්තමේන්තු |

| | | | |
|---|---|---|---|
| | | | ප්‍රධානි මඟින් එම නිළධාරියා දැනුවත් කර ඇත. |
| (ආ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවා කාලය වර්ෂ 5 ක් ඉක්මවා සිටින නිලධාරින් සම්බන්ධයෙන් ස්ථානමාරු කිරීමේ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කර නොතිබුණි. | 2001 අගෝස්තු 22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2001 ප්‍රකාරව ක්‍රියා කළ යුතු බව. | වර්ෂ 05කට වැඩි ඒකාබද්ධ සේවයේ නිලධාරින් සම්බන්ධයෙන් අභ්‍යන්තර ස්ථාන මාරු හා වාර්ෂික ස්ථාන මාරු මඟින් ස්ථාන මාරු කිරීමට යෝජනා කර ඇත. ඇතැම් ස්ථාන මාරු ක්‍රියාත්මක වුවද පවතින අධික පුරප්පාඩු හේතුවෙන් ඇතැම් අයවළුන් වසර 05 ඉක්මවා කාර්යාලවල රඳවා තබා ගැනීමට සිදුව ඇත. |
| (ඇ) | 2015 නොවැම්බර් සිට 2018 ජනවාරි දක්වා කාලය තුලදී කින්නියා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ විශ්‍රාමිකයින් තිදෙනකු වෙත වැඩිපුර ගෙවූ බවට හඳුනාගෙන තිබුණු රු. 495,978 ක් ආපසු අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | වැඩිපුර ගෙවා ඇති විශ්‍රාම වැටුප අයකර ගැනීමට ක්‍රියාකළ යුතු බව. | මෙම විශ්‍රාමිකයන් තිදෙනාගේ වැඩිපුර ගෙවන ලද මුදල් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් අයකර ගැනීමට කටයුතු කරගෙන යනු ලැබේ. |
| (ඈ) | 2002 සිට 2014 දක්වා කාලය තුල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අයත් වාහන 09 කට සිදු වී තිබුණු අනතුරු වල වටිනාකම රු.4,699,905 ක් ලෙස ගණනය කර තිබුණු නමුත් අදාළ පරීක්ෂණ කටයුතු ප්‍රමාදවීම නිසා අයකිරීම් කටයුතු සිදුකර නොතිබුණි. | වාහන අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 (3) සහ 104 (4) ප්‍රකාරව ක්‍රියාකළ යුතු බව. | අදාළ අනතුරුවලින් ඇතැම් ඒවා වසර 20කට වඩා පැරණි වන අතර ඒ පිළිබඳ ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා කමිටු පත් කර ඇත.තවදුරටත් අනතුරු 06ක ගොනු අවසන් කළ යුතුව ඇති අතර, අනෙකුත් ගොනුවල කටයුතු අවසන් කර ඇත.2019 තුන්වන කාර්තුව අවසන් වීමට පෙර සියලුම කටයුතු අවසන් කිරීමට සැලසුම් කර ඇත. |

**4.** **තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසාර ඉලක්කයන් පිළිබඳ නිලධාරීන් ප්‍රමාණවත් පරිදි දැනුවත් වී නොතිබුණු අතර තිරසාර සංවර්ධන ඉලක්කයන් නිවැරදිව හඳුනා ගැනීම සිදුවී නොමැති නිසා සමාලෝචිත වර්ෂයේ ඉලක්කයන් සපුරා ගැනීම පිළිබඳ ඇගයීමක් කිරීමට නොහැකි විය. | තිරසාර සංවර්ධන ඉලක්කයන් හඳුනා ගැනීම හා ක්‍රියාත්මක කිරීම සිදු කළ යුතු බව. | අභ්‍යන්තර පාලන පද්ධතිය වඩාත් විධිමත් කිරීම හා නිලධාරීන් වෙනුවෙන් ධාරිතා පුහුණු වැඩසටහන් පවත්වා සම්පත් පූර්ණ උපයෝජනය මෙන්ම මනා සම්පත් කළමනාකරණය ද රාජ්‍ය අංශයේ පවතින නෛතික රාමුව තුළ විනිවිදභාවයෙන් යුතුව කටයුතු කිරීමට අවශ්‍ය පරිසරය ශක්තිමත් කිරීමට ද පියවර ගෙන ඇත. එමගින් තිරසාර සංවර්ධන ඉලක්ක වෙත ප්‍රවේශ වීමට අවශ්‍ය පසුබිම සකසා ඇති බව අවධාරණය කරමි. |

**5.** **මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විධායක මට්ටමට අයත් තනතුරු පුරප්පාඩු 15 ක්ද තෘතීක මට්ටමට අයත් නිළධාරි තනතුරු පුරප්පාඩු 20 ක්ද ද්විතික මට්ටමට අයත් නිළධාරි තනතුරු පුරප්පාඩු 163 ක් හා ප්‍රථමික මට්ටමට අයත් නිළධාරි තනතුරු පුරප්පාඩු 31 ක්ද වශයෙන් මුළු පුරප්පාඩු ප්‍රමාණය 229 ක් පිරවීම සඳහා කටයුතු කර නොතිබුණි. | අත්‍යාවශ්‍ය තනතුරු පුරප්පාඩු පිරවීමට වහා අවධානය යොමු කර ඒවා පිරවීමට කටයුතු කළ යුතු බව. | පුරප්පාඩු තනතුරු පිරවීම සඳහා අවධානය යොමු කරන ලෙස රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත දන්වා ඇති බව කාරුණිකව දන්වා සිටිමි. |